# නැගෙනහිරට වෙනම ආණ්ඩුකාරවරයෙක්

තායිලන්ත බෝක්කු හෙවත් සංවර්ධන සාකච්ඡාවල මෙවර සැසියේදී උතුරු හා නැගෙනහිර පළාත්වල සංවර්ධනය හා ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ඊනියා ඒකාබද්ධ කාර්ය සාධක බලකායක් පිහිටුවීම ගැන සාකච්ඡා කිරීමට නියමිතව තිබිණි. මේ ඊනියා බලකාය පත් කිරීම පිළිබඳ විස්තර අඩංගු නිවේදනය පළවුයේ ඉංගිරිසියෙන් පළවන ඩේලි මිරර් පත්‍රයෙහි පමණකි. ඒ පත්‍රය රනිල් වික්‍රමසිංහ මහතාගේ ඥාතියකු වූ රංජිත් විජේවර්ධන මහතාට අයත් ටයිම්ස් සමාගමේ ප්‍රකාශනයකි. එසේ පළවුයේ නැත්නම් පළකෙළේ කිනම් අරමුණකින් ද යන්න එතරම් පැහැදිලි නැත. එහෙත් දැනටමත් ඊනියා බලකායට එරෙහිව නිකුත් කර ඇති ජනමාධ්‍ය ප්‍රකාශන පළවී හෝ ප්‍රචාරය කෙරී ඇත්තේ ද ටයිම්ස් සමාගමෙන් නිකුත් කරන සිංහල පුවත්පතක හා රනිල් වික්‍රමසිංහ මහතාගේ සොහොයුරු ශාන් වික්‍රමසිංහ මහතාට අයත් ටී. එන්. එල්. රූපවාහිනිය හා මහාරාජා සමාගමට අයත් එම්. ටී. වී. නාලිකාවත් වීම තරමක ගැටළු සහගතය.

ඊනියා ඒකාබද්ධ බලකාය පිහිටුවීම පිළිබඳ ආණ්ඩුව තුළ මතභේදයක් ඇත්දැයි අපි නොදනිමු. එවැනි මතභේද තිබුණද ඒ තරම් සැලකිය යුතු දැ නොවේ. අවසානයේදී සියල්ල තීරණය කෙරෙන්නේ ඇමරිකානු තානාපති හා බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් විසින්ය.

ඒ තීරණ ක්‍රියාත්මක කිරීමේදී නෝර්වේ තානාපති පණිවුඩ කරුවකු අතරමැදියකු හා බාග හවුල්කරුවකු ලෙස ක්‍රියා කරයි. කෙසේ වෙතත් තායිලන්ත බෝක්කු සාකච්ඡා මෙවර වටයේදී ඊනියා සංවර්ධන සාකච්ඡා ස්වරූපයක් ගැනීමට නියමිතය. මේ වටයේදී සිදුවීමට නියමිතව ඇත්තේ කුමක්ද?

පාවාදීමේ ලියවිල්ල හෙවත් ඊනියා අවබෝධතා ලියවිල්ල මගින් ආණ්ඩුව ලවා බටහිරයන් විසින් පියවර ගැණුනේ ලංකාණ්ඩුව හා කොටි ත්‍රස්තවාදී සංවිධානය සම මට්ටමකට ගෙන ඒමටය. කොටි ත්‍රස්තවාදී තහනම ඉවත් කිරීමෙන් බලාපොරොත්තු වුයේ ආණ්ඩුවේ හමුදා හා ආයුධ ගත් කොටි සාමාජිකයන් එක මට්ටමකට ගෙන ඒමය. කොටින්ට ඊනියා අධිකරණ, පොලිසි ඇතුළු පාලන තන්ත්‍රයක් පවත්වාගෙන යෑමටත්, නීති විරෝධීව කප්පන් ගැනීම් ආදී වෙනත් එවැනි ක්‍රියාවල නිරත වීමටත් ඉඩ දෙනු ලැබිණි. කොටි ත්‍රස්තවාදීහු හමුදා සෙබළු අල්ලා ගැනීමටද පසුබට නොවුහ. එහෙත් ඔවුන්ට විරුද්ධව පියවර නොගැණුනි. ඒ වෙනුවට ආරක්ෂක අමාත්‍යාංශයේ නිවට නිලධාරීහු හමුදාවේ ඉහළම නිලධාරීන් කොටි ත්‍රස්තවාදීන්ගේ තුන්වැනි පෙළේ සාමාජිකයන් සමඟ එක පෙළට වාඩි කරවීමට පියවර ගත්හ. ආණ්ඩුව නිවටව කොටි සංවිධානය දෙමළ ජනයාගේ එකම නියෝජිතයා බවට පිළිගෙන ඇත. ඒ හැරෙන්නට පිට කොන්දක් නැති දෙමළ ජාතික සංධානය ද කොටි දෙමළ ජනයාගේ එකම නියෝජිතයා බවට පිළිගෙන ඇත. ආණ්ඩුව අද කොටි සමඟ සාකච්ඡා කිරීමට තායිලන්තයට ගොස් ඇත්තේ මේ ක්‍රියාදාමය තවදුරටත් ඉදිරියට ගෙන යෑමටය. ජී. එල්. පීරිස්, ඇන්ටන් බාලසිංහම් සමඟ එකම ගුවන්යානයේ කොළඹ සිට බැංකොක් බලා යයි. මොවුන්ට මුදල් වියදම් කර බැංකොක් නොගොස් ලංකාවේදීම මේ සාකච්ඡා පැවැත්වීමට නොහැකි ඇයි දැයි කිසිවකුට ප්‍රශ්න කළ හැකි නමුත් ජී. එල්. පීරිස් එයට ආරක්ෂාව සඳහා වැනි බොරු උත්තරයක් දෙනු නොඅනුමානය. ජී. එල්. පීරිස් ආණ්ඩුවේ මුදල් වියදම් කිරීමට රුසියෙකි. ඒ බවට මට පෞද්ගලික අත්දැකීම් ඇත.

යෝජිත ඊනියා ඒකාබද්ධ කාර්ය සාධක බලකාය කාරිය කෙරෙන තුරු අටවා ගන්නා බාලකායක් පමණකි. එහි ආණ්ඩුවේ නියෝජිතයෝ තිදෙනෙක්ද කොටි ත්‍රස්තවාදී සංවිධානයේ නියෝජිතයෝ තිදෙනෙක්ද වෙති. කොටි නියෝජිතයන් තුන්දෙනා සමස්ත උතුරු හා නැගෙනහිර පළාත් වෙනුවෙනි. එහි කාර්ය වනුයේ අන්තර්පාලනයක් ලැබෙන තුරු ඊනියා සංවර්ධන කටයුතු මෙහෙයවීමය. ඒ සඳහා අධ්‍යක්ෂවරයකු යටතේ ඊනියා බලකායට වගකියන පාලන තන්ත්‍රයක්ද ඇති කෙරෙයි. ඊනියා බලකාය පිහිටුවන්නේ, එනම් ස්ථාපිත කරන්නේ කවුද කෙසේද යන්න සඳහන් නොවේ. බොහෝ විට එය තායිලන්ත සාකච්ඡාවලම ප්‍රතිඵලයක් ලෙස ස්ථාපිත කෙරෙනු ඇත. මේ බලකාය එබැවින් ජනාධිපතිනියට, පාර්ලිමේන්තුවට හෝ කිසියම් අමාත්‍යාංශයකට වගකියන ආයතනයක්ද නොවේ. එය හුදෙක් අග්‍රාමාත්‍ය කාර්යාලයට වාර්තා කරන (මේ වචනය ඉතා වැදගත්ය. වගකීමක් ගැන කිසිම සඳහනක් නොවේ.)

© Prof. Nalin De Silva

ආයතනයක් පමණක් වෙයි. අලි මදිවාට හරක් කීවාක් මෙන් ඒ ආයතනයේ ද ඊනියා පහසුකම් සපයන්නා ලෙස නෝර්වේ නියෝජිතයා පත්වෙයි. පහසුකම් සපයන්නා යන්න අද කුණුහරුපයක් බවට පත් වී ඇත. පහසුකම් සැපයීමට පැමිණි නෝර්වේ රට අද උතුරු හා නැගෙනහිර සියලු කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වෙයි. නෝර්වේ රටට ආරාධනා කළේ ජනාධිපතිනිය යැයි ඔවුන් කියනු ඇත. එහෙත් ඇත්ත තත්ත්වය නම් නෝර්වේ රටට ආරාධනා කරවනු ලැබූ බවය. එය බටහිරයන්ගේ මැදිහත්වීමෙන් කෙරුණක් බවට සැකයක් නැත. නෝර්වේ නියෝජිතයන් අද කෙතරම් මෙරට කටයුතුවලට ඇඟිලි ගසන්නේදැයි කිවහොත් ඔවුන් කරන කියන දෑ පිළිබඳ ජනාධිපතිනිය ද තම අප්‍රසාදය පළ කර ඇත. නෝර්වේ නියෝජිතයන්ට තම තානාපති රෙඩ්බානා සංවිධානයේ සභාපති ලෙස කටයුතු කරන සමයේ සිට දෙමළ ජාතිවාදයට ආධාර කිරීමේ ඉතිහාසයක් ඇත. මොවුහු අද සිංහලයන් රැවටීමේ ක්‍රියාවලියක නිරත වී සිටිති. පසුගියදා හම්බන්තොට දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමට යැයි කියමින් නෝර්වේ නියෝජිතයන් පිරිසක් එහි සංචාරය කළේ එහි වැසියන්ගේ යහපතට නම් නොවේ. ඒ හුදෙක් රැවටිල්ලකි. ඔවුන් උතුරු හා නැගෙනහිර පළාත්වල පමණක් නොව අනෙක් ප්‍රදේශවලද සංවර්ධනය ගැන උනන්දුවක් දක්වන බව ජනතාවට පෙන්වීම මෙම ගමනේ අරමුණය. අද පමණක් නොව අතීතයේද දිවයිනේ අනෙක් පෙදෙස්වල සංවර්ධනය සඳහා තමන් සහභාගි වී ඇති බව නෝර්වේ තානාපති කාර්යාලය පවසනු ඇත. එහෙත් ඒ බයිලා පමණකි.

ජී. එල්. පීරිස් පවසන්නේ ඊනියා සාම වැයම ගැන සතුටට පත් වී ඇති බටහිරයන් ඒ සඳහා ආණ්ඩුවට පොඩි දීමනාවක් ලබා දෙන බවත් එය සුදුසු ලෙස වියදම් කිරීම සඳහා ඊනියා බලකාය පිහිටුවන බවත් ය. මේ සුප්‍රසිද්ධ පීරිස් බයිලාය. ආණ්ඩුවේ පාවාදීමේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් බටහිරයන් සතුටට පත් වී ඇති බව අපි ද දනිමු. එහෙත් ඒ සතුට වෙනුවෙන් ආණ්ඩුවට පොඩි ගතමනාවක් දීමට බටහිරයන් ඉදිරිපත් වේද? "හොඳ වැඩක්" කළ විට හුළං විස්කෝතුවක් තෑගි වශයෙන් ලබා ගන්නා පොඩි දරුවකුගේ තත්ත්වයට ආණ්ඩුව ඇද වැටී ඇත්ද? බටහිරයන් එවැනි ගතමනා දෙන්නේ ආණ්ඩුවට නොව ආණ්ඩුවේ සාමාජික පුද්ගලයන්ට බව නම් රහසක් නොවේ. ඒ ගතමනා බටහිර බැංකුවලම සංසරණය වන්නේ යැයි අපේ වැනි රටවල් ගැන ලියන බටහිරයෝම පවසති. ඊනියා කාර්ය සාධක බලකාය පිහිටුවන්නේ මේ පොඩි ගතමනාව උතුරු හා නැගෙනහිර පළාත්වල වැසියන් කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන්, ඒ පළාත් සංවර්ධනය සඳහා වියදම් කිරීමට යැයි ජී. එල්. පීරිස් පවසන්නේ කිනම් කටකින් දැයි තීරණය කිරීම පාඨකයන්ටම භාර කරමි. අද ආණ්ඩුවට හා බටහිරයන්ට ප්‍රශ්නය වී ඇත්තේ අන්තර් පාලන මණ්ඩලය පාර්ලිමේන්තුව හරහා පිහිටුවීමට අවශ්‍ය බහුතරය නොමැති වීමය. පසුගියදා ජනාධිපතිනියගේ බලතල කපා දැමීමට හැකිවන අයුරින් හා මන්ත්‍රීවරුන්ට පක්ෂ මාරුකිරීමට ඉඩ ලැබෙන අයුරින් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළේ මේ බහුතරය ලබාගෙන අවුරුදු කිහිපයක් බලයේ රැඳී සිටිමින් පාවා දීමේ කටයුත්ත දිගින් දිගටම කිරීමටය. එහෙත් එය ව්‍යර්ථ විය. ආණ්ඩුව දැන් විකල්ප ක්‍රමය අනුගමනය කරති. එනම් කොටි සංවිධානයට උතුරු හා නැගෙනහිර පළාත් භුක්තියට සවි කර දීමමය. දැන් මේ සූදානම් වන්නේ පළමුව කොටින්ට භුක්තිය ලබාදීමටය. ඊනියා සංවර්ධන බලකාය ඒ සඳහාය. පාවාදීමේ ලියවිල්ලෙන් හා කොටි තහනම ඉවත් කිරීමෙන් ගත් ක්‍රියාමාර්ගය තව දුරටත් ඉදිරියට ගෙන ගොස් උතුරු හා නැගෙනහිර පළාත්වල පාලනය කොටින්ට පවරා දීමට මෙහිදී පියවර ගැනෙයි. කොටි ඊනියා බලකායෙහි දෙමළ ජනයා පමණක් නොව, උතුරු හා නැගෙනහිර පළාත්වල සිංහල හා මුස්ලිම් ජනයා ද ඇතුළුව මුළු මහත් ජනතාවම නියෝජනය කරයි. ඊනියා බලකායෙහි නැගෙනහිර පළාතේ සිංහලයන් නියෝජනය කරන්නේද කොටි සංවිධානයයි. උතුරු හා නැගෙනහිර පළාත් සිංහලයන්ගේ නිජභූමිය නොවේ යැයි පවසන කොටිම සිංහල ජනයා නියෝජනය කරති. නැගෙනහිර පළාතේ හා උතුරු පළාතේ සිංහලයන්ට සිදුවනු ඇත්තේ තම ගම් බිම් හැර දා යෑමට සූදානම් වීමය.

ඊනියා බලකාය ක්‍රියාත්මක වී ටික කලකින්ම ඊළඟ පියවර ලෙස එය අන්තර් පාලන මණ්ඩලය බවට නම වෙනස් කර ගනු ඇත. එය තායිලන්තයේ කිනම් වටයේදී සිදුවේදැයි කිව නොහැකි වුවත් සිදුවන බව නම් පැහැදිලිය. අන්තර්පාලනය සහසන්ධීය රජ්‍යය බවට පත්වීමත් සහසන්ධීය රාජ්‍යය ඊළම බවට පත්වීමත් කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණක් වනු ඇත. පාර්ලිමේන්තුව හා ජනාධිපතිනිය මග හැර ඊළම පිහිටුවීම අද සැලැස්ම බවට පත්වී ඇත. අප ඉල්ලා සිටිය යුත්තේ කුමක්ද? ඇතැම් සිංහලයන් කියනු ඇත්තේ ඊනියා බලකායට සිංහල නියෝජිතයකුද පත් කළ යුතු යන්නය. එය අනුවණ ක්‍රියාවකි. එයින් ඊනියා බලකාය පිළිගැනීමක් සිදු වෙයි. අප කළ යුත්තේ සිංහල නියෝජිතයන් ඇතිව හෝ නැතිව හෝ කාරිය කෙරෙන තුරු බලකාය ප්‍රතික්ෂේප කිරීමය. කාරිය කෙරෙන තුරු බලකාය අවශ්‍ය වන්නේ කාහටද? ඊනියා බලකායක් යෝජනා කළ හැක්කේ උතුරු හා නැගෙනහිර පළාත් එක්කර

© Prof. Nalin De Silva

ඇත්නම් පමණකි. උතුරු හා නැගෙනහිර පළාත් එක් කිරීමෙන් දෙමළ ජාතිවාදීන් බලාපොරොත්තු වන්නේ නැගෙනහිර පළාතේ 70% කට වැඩි බහුතරය වු සිංහල හා මුස්ලිම් ජනයා එක් කරන ලද පළාත් දෙකෙහි සුළුතරය බවට පත්කිරීමය. දෙමළ ජාතිවාදීන්ගේ උපක්‍රමය වී ඇත්තේ කෙසේ හෝ බහුතරය සුළුතරය බවට පත්කිරීමය. පසුගිය සියවසේ මුල සිටම ව්‍යවස්ථාදායක සභාවේ ඔවුන් උත්සාහ කළේ සිංහලයන් කෘත්‍රිම ආකාරයකින් ව්‍යවස්ථාදායකය තුළ සුළුතරය බවට පත් කිරීමටය. උතුරු හා නැගෙනහිර පළාත් එක් කරනු ලැබුයේ ඉන්දු ලංකා ගිවිසුම අනුව හදිසි නීති රෙගුලාසි යටතේය. එයට එජාපය පවා විරුද්ධය. ඉන්දියාව ද විරුද්ධ වු නමුත් ඒ පළාත් එක් කරන්නේ නම් ඒ පිළිබඳ වසරක් ඇතුළත ජනමත විචාරණයක් පැවැත්විය යුතු ය යන කොන්දේසිය යටතේ අවසානයේදී එයට පක්ෂ විය. ජයවර්ධන හා ප්‍රේමදාස ජනාධිපතිවරු දෙදෙනාම ජනමත විචාරණයකදී එක් කිරීමට විරුද්ධව කටයුතු කරන බව ප්‍රකාශ කළහ. ශ්‍රීලනිප, මඑපෙ, ජවිපෙ පමණක් නොව මුස්ලිම් කොංග්‍රසයද (කොටස් දෙකම) ඊ.පී.ඩී.පී.යද එක් කිරීමට විරුද්ධය. මේ පක්ෂ එකක්වත් මා දන්නා තරමින් තම ප්‍රතිපත්තිය වෙනස් කර නැත. අද ප්‍රධාන යැයි කිව හැකි පක්ෂවලින් එක් කිරීමක් අවශ්‍ය වී ඇත්තේ කොටි සංවිධානයේ බළල් අතක් වී ඇති නිවට දෙමළ ජාතික සංධානයට පමණකි. පසුගිය වසරවල බටහිර බලා ගිය දෙමළ ජනයා නිසා අද මෙරට දෙමළ ජනගහනය අඩු වී ඇත. දෙමළ ජනයාගෙන්ද සියල්ලන්ටම එක් කිරීම අවශ්‍ය යැයි කිව නොහැකිය. මේ සියල්ලෙන් කියැවෙන්නේ උතුරු හා නැගෙනහිර පළාත් එක් කිරීම අවශ්‍ය වන්නේ ඇංකරයන්ට හා 10% කටත් අඩු දෙමළ ජාතිවාදීන්ට බවය. රටේ ජනගහනයෙන් 90% කට වැඩි පිරිසකට 10% කට අඩු පිරිසකගේ අසාධාරණ ඉල්ලීමකට එකඟ වීමට බලකරන්නෝ බටහිරයෝය. අද කොටින්ට ඇත්තේ ආයුධවල බලය නොව බටහිරයන්ගේ බලයය.

හදිසි නීතිය ඉවත් කිරීමෙන් පසුව හදිසි නීති රෙගුලාසි අවලංගු වී උතුරු හා නැගෙනහිර පළාත් වෙන් වී ඇත. අද ඒ පළාත් කිසිම නීතියකින් එක් කෙරී නැත. ඒ අතර සම්බන්ධයක් ඇත්තේ හුදෙක් මේ පළාත් දෙකටම එකම ආණ්ඩුකාරවරයකු පත් කර සිටීමෙන් පමණකි. අද ජනාධිපතිනිය කළ යුත්තේ ආයුධ සන්නද්ධ වීමට හෝ බටහිර බලපෑමට හෝ යටත් නොවී නැගෙනහිර පළාතට වෙනම ආණ්ඩුකාරවරයකු පත් කිරීමය. උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනය සඳහා වෙනත් පළාත්වල නොමැති ආයතනයක් (ඊනියා බලකාය) ස්ථාපිත කිරීම අනෙක් පළාත්වල ජනයාගේ මූලික අයිතියක් නැති කිරීමකි. ඒ ඒ පළාත්වලට වෙන වෙනම ක්‍රියා කිරීම ව්‍යවස්ථා විරෝධී මූලික අයිතිවාසිකම්වලට පටහැනි ක්‍රියාවකි. උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනය කිරීමට ඊනියා බලකායක් නැතිවාට පවත්නා ව්‍යවස්ථාදායක පරිපාලන ව්‍යුහයන් යොදා ගත හැකිය. වෙන වෙන පළාත්වලට වෙන වෙනම ක්‍රියා කිරීම යනු රනිල් වික්‍රමසිංහ මහතා කලකට ඉහත ප්‍රකාශයට පත් කළ ඊනියා අසමමිතික (අසමජ්ජාති) බලය බෙදීම ක්‍රියාත්මක කිරීමකි. නැගෙනහිර පළාතට වෙනම ආණ්ඩුකාරවරයකු පත් කර මේ ක්‍රියාදාමය නැවැත්විය හැකිය.

මෙම ලිපිය ලියා පිටවීමෙන් පසුව ලැබුණු තොරතුරු අනුව තායිලන්ත රජය මින් පසු සාකච්ඡා පැවැත්වීමට ඉඩනොදීමට තීරණය කර ඇත. මින් පසු ආණ්ඩුව හා කොටි ත්‍රස්තවාදී සංවිධානය අතර සාකච්ඡා පැවැත්වෙනු ඇත්තේ නෝර්වේ රටේ ඔස්ලෝ නුවරදීය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva